# සීතාවක ප්‍රාදේශීය සභාවේ 2020 ජූලි මස 10 වන දින පෙ.ව.10.00 ට ප්‍රාදේශීය සභාවේ සභා ශාලාවේදී පවත්වන ලද මහ සභා රැස්වීමේ වාර්තාව.

**සහභාගී වූ : -**

1. ගරු සභාපති - ජී. ජයන්ත රෝහණ මැතිතුමා
2. ගරු උප සභාපති - එස්.ඩී.මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ඒ.මේරි මාග්‍රට් මැතිතුමිය
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ආර්. ගයාන් දුමින්ද චන්ද්‍රසිරි මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.පී. යසරු දෙවන්මිණ රාජපක්ෂ මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ.ඩී.එස්. ජයන්ත රණවක මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ. මංජුල ධම්මික වීරරත්න මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ඒ.ඩී. ෆිලීෂියා ඈනට් ඔල්ගා මැතිතුමිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ. ප්‍රේමරත්න මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී. සනී හෙක්ටර් පීරිස් මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී. කෝකිල සම්පත් වර්ණසිරි මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.නන්ද කුමාරසිංහ මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ. උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී. ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ. උපුල් ජිනේන්ද්‍ර කුලතිලක මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සුසන්ත සිසිර කුමාර රූපසිංහ මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී. ගීතාමනී ස්වර්ණලතා මැතිතුමිය
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ. සුසන්ත මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ඩී. සමන්ත කුමාර මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්. වරුණ දිලිප් කුමාර මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.පී.උපුල් ප්‍රසන්න මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඩී. චින්තක දේවින්ද සමරවීර මැතිතුමා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ. නිමල් යසසිරි කළුපහන මැතිතුමා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයෝම මධු ප්‍රසාද් දේවගේ මැතිතුමා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්. අසෝක වැලිකල මැතිතුමා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්. චන්ද්‍රකුමාර් මැතිතුමා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී. කුමුදිණි ජයවර්ධන මැතිතුමිය
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ශෂිණි ශ්‍රීමාලි හෙට්ටිආරච්චි මැතිතුමිය
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ජී.ඩී. ඉන්ද්‍රානි සෙනෙහෙලතා පද්මසීලි මැතිතුමිය
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ඩී. මාලනී චන්ද්‍රලතා මැතිතුමිය
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ.ඩී.සාගරිකා කුමාරි රූපසිංහ මැතිතුමිය
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඥාණ ප්‍රකාසම් ෆැන්සිස් මැතිතුමා
35. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එස්.සුනිල් රණසිංහ මැතිතුමා
36. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.පී.කේ. සමන්ති චන්ද්‍රිකා දමයන්ති මැතිතුමිය

37. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ඒ.ප්‍රදිප් කුමාර් මැතිතුමා

**<u>සහභාගි නොවූ</u>**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - චන්දන ප්‍රේමනාත් මුදුන්කොටුව මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ඒ.විමල් ප්‍රසන්න මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ලියනගේ චන්දන කුමාර මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - දනුෂ්කි ප්‍රභානි අල්මේදා මැතිතුමිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පුස්සැල්ලගේ අමල් නිශාන්ත සිල්වා මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්. චන්දන සූරියආරච්චි මැතිතුමා

**<u>ගරු සභාපතිතුමා</u>**

සුභ උදෑසනක් වේවා. සීතාවක ප්‍රාදේශීය සභාවේ 2020 ජූලි මාසයේ 27 වෙනි මහ සභා රැස්වීමේ කටයුතු ආරම්භ කිරීමටයි සූදානම් වෙන්නේ.

ඒ සඳහා සහභාගි වීමට පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා ගරු මන්ත්‍රීතුමියන්ලා සියළුදෙනාම ඉතාමත්ම ගෞරවයෙන් මේ අවස්ථාවේදී පිළිගන්නවා. ලේකම්තුමා ප්‍රධාන නිලධාරි මණ්ඩලය ඒවගේම කාර්ය මණ්ඩලය සියළුදෙනාමත් ජනමාධ්‍යවේදි මහත්වරුන් සියළුදෙනාමත් ඉතාමත් ගෞරවයෙන් සභාවට පිළිගන්නවා.

න්‍යායපත්‍රානුකූලව පළමුවෙන්ම තියෙන්නේ පහුගිය සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කර ගැනීම.

සංශෝධන හා වෙනස්කම් ඇතොත් පෙන්වා දීලා පහුගිය සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කරන ලෙස ඉල්ලා සිටිනවා.

## <u>01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කර ගැනීම.</u>

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගීතාමණී ස්වර්ණලතා මැතිතුමිය</u>**

ගරු සභාපතිතුමනි, 2020.06.10 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මේරි මාග්‍රට් මැතිතුමිය</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**<u>2020.06.10 වන දින පැවති මහ සභා රැස්විමේ වාර්තාව පිළිගත යුතු සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගීතාමණී ස්වර්ණලතා මැතිතුමියගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මේරි මාග්‍රට් මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.</u>**

## <u>02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.</u>

01. ආරක්ෂක අමාත්‍යාංශය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ ජනරාල්, මේජර් ජනරාල් (විශ්‍රාමික) සුදන්ත රණසිංහ ආර්ඩබ්පී ආර්එස්පී එම්එස්සී එන්ඩීයු පීඑස්සී මහතා විසින් ඉහළ කොස්ගම දේවාලවත්ත මාර්ගයේ පැති බැම්ම සම්බන්ධව යන හිසින් යුතුව 2020.03.13 දිනැතිව යොමු කරන ලද ලිපියේ පිටපත.

02. සී/ස නෙක්ෆා ඔස්ට්‍රේලියා (පුද්) සමාගම, අධ්‍යක්ෂ විසින් වරිපනම් මෘදුකාංගය නොමිලේ ලබා දීම යන හිසින් යුතුව යොමු කරන ලද ලිපිය.
මේ සම්බන්ධව අපිට වෙනත් අවස්ථාවක කාරක සභාවක් බවට පත් කර සාකච්ඡා කිරීමට හැකියාව තියෙනවා.

03. ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය සාමාන්‍යාධිකාරි එම්.ජේ.ඩී.ප්‍රනාන්දු මහතා විසින් 2020.03.10 දින පැවති මහ සභා රැස්වීමේදී ඉදිරිපත් කරනු ලැබු ගරු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික ප්‍රකාශ ක්‍රියාත්මක කිරීම යන හිසින් යුතුව 2020.06.23 දිනැතිව යොමු කරන ලද ලිපියේ පිටපත.

## <u>03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.</u>

### <u>03 - (01) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නන්ද කුමාරසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.</u>

01. කොස්ගම, බොරළුගොඩ, අංක 79/ඩී හි එස්.එම්.ඩී.ජී. මුදලිගේ යන අය විසින් " කොන්ක්‍රීට් නිෂ්පාදන වැඩපලක් නිසා සිදුවන මහජන පිඩාකාරි කරදරය" යන හිසින් යුතුව ඉහත ලිපිනයේ පදිංචි අයගේ නිවසට යාබදවමහා පරිමාණයේ කොන්ක්‍රීට් භාණ්ඩ ගොඩනැගිලි නිෂ්පාදන හා වෙනත් නිෂ්පාදන වැඩපලක් හේතුවෙන් නිවැසියන්ට හා ඔහුට සිදුවන පීඩාකාරි තත්වය පිළිබඳව පරික්ෂා කර බලා සාධාරණීය විසඳුමක් ලබා දෙන ලෙස 2020.06.30 දිනැතිව ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

### <u>03 - (02) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.</u>

02. කොස්ගම, කණම්පැල්ල, කපුගොඩැල්ල, අංක 190/බී හි කේ. උපාලි රංජිත් යන අය විසින් " නිවාස වෙත ගමන් කරන මාර්ගය පුළුල් කර සංවර්ධනය කර ගැනීම" යන හිසින් යුතුව

ඉහත ලිපිනයේ පදිංචි අයගේ නිවසට යන මාර්ගය පුළුල් කිරීම සඳහා එක් අයෙකුගේ විරෝධතාවයක් ඇති බැවින් සාධාරණයක් සිදු වන පරිදි මෙම මාර්ගය පුළුල් කර දෙන ලෙස ඉල්ලමින් අසල්වැසියන්ගේ අත්සන්ද සමඟ 2020.07.05 දිනැතිව ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

03. කොස්ගම, ඉ/කොස්ගම, අළුබෝද්ල අංක 44/1/A, එම්. ශ්‍රීයානි යන අය විසින් " ඇළ මාර්ගය හරහා ඒ දණ්ඩක් ලෙස අබලන් වූ විදුලි කණු ලබා ගැනීම සඳහා" යන හිසින් යුතුව ඉ/ කොස්ගම මැද අලුබෝද්ල පදිංචි අපහට මැද අලුබෝද්ල හරහා ගලා බසින ඇල හරහා ගමන් කිරීම සඳහා යොදා ඇති පොල් කොටන් දිරා ඇති බැවින් විදුලි බල මණ්ඩලයෙන් පරණ විදුලි කණු 04 ක් ලබා දෙන ලෙස ඉල්ලමින් 2020.06.28 දිනැතිව මා අමතා යොමු කරන ලද ලිපිය.

04. අවිස්සාවේල්ල ඩිපෝව සහකාර කළමනාකාර යන අය විසින් " මාර්ග අංක 694 - පූගොඩ - අවිස්සාවේල්ල මාර්ගයේ ධාවනය වන බස් රථ රාත්‍රී ගාල් කිරීම සම්බන්ධවයි." යන හිසින් යුතුව බස්රථ ගාල් කිරීම සඳහා කොස්ගම ඩැනී විජේසුන්දර ක්‍රීඩාංගනය හෝ වෙනත් ආරක්ෂිත ස්ථානයක් ලබා දෙන ලෙස ඉල්ලමින් 2020.07.02 දිනැතිව මා අමතා යොමු කරන ලද ලිපිය.

**03 - (03) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චින්තක දේවින්ද සමරවීර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.**

පාදුක්ක, ජයන්තිපුර, ජයන්ති මාවත, අංක 325/1 හි සමන් වීරසිංහ යන අය විසින් ඔහුගේ තාප්පයට සම්බන්ධ කර ඇති සිමෙන්තියෙන් සෑදු පෝරණුව, සින්ක් එක හා කාමරංකා ගස, ඇක්ටේරියා ගස ඉවත් කර නොමැති බවත් අනාරක්ෂිත ලෙස ඉදි කර ඇති වැසිකිළි වල නිසාද තාප්පයට හානි සිදුවී ඇති බවත් විශාල වියදමක් දරා තාප්පය අලුත්වැඩියා කර ඇත. තාප්පයට සම්බන්ධ කර ඇති පෝරණුව හා සින්ක් එක හා ගස් ඉවත් කර දීමට කටයුතු කර දෙන මෙන් ඉල්ලමින් 2020.07.06 දිනැතිව ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

**03 - (04) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් දුමින්ද මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.**

මාවතගම ඉසුරු මාවත ප්‍රදේශවාසීන් විසින් "ජල සැපයුම ලබා ගැනීම සම්බන්ධයෙනි" යන හිසින් යුතුව පානීය ජල පහසුකම් ලබා ගැනීමේදී මාර්ගයට සිදුවන හානිය යථාතත්වයට පත් කරන දෙන ලෙස ඉල්ලමින් ප්‍රදේශවාසීන්ගේ අතසන් ලේඛනයක්ද සමඟින් 2020.06.30 දිනැතිව ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

**03 - (05) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩී. සමන්ත කුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.**

පිටුම්පේ දකුණ ප්‍රදේශවාසීන් විසින් " පිටුම්පේ දකුණ වෙන්දේසි කරන ලද ඉඩම වෙත දිවෙන අතුරු මාර්ගය / පිටුම්පේ උතුර , දකුණ යා කෙරෙන කෙටි මාර්ගය (දුර මීටර් 145) පිලිසකර කිරිම සඳහා ඉල්ලුම් කිරිම." යන හිසින් යුතුව පිටුම්පේ දකුණ සෝමානන්ද මාවතේ වික්‍රමපාල මහතාගේ නිවස අසලින් වම් පසට වෙන්දේසි කරන ලද ඉඩම දෙසට දිවෙන අතුරු මාර්ගය තාර අතුරා පිලිසකර කර දෙන ලෙස ඉල්ලමින් ප්‍රදේශවාසීන්ගේ අත්සන් ලේඛනයක්ද සමඟින් 2020.06.30 දිනැතිව ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

**<u>03 – (06) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කුමුදිණි ජයවර්ධන මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලදී.</u>**

පාදුක්ක, හංවැල්ල නො: 36 හි රේණුකා දමයන්ති යන අය විසින් "බලපත්‍ර නොමැති ජංගම වෙළඳ රථ පිළිබඳ පැමිණිල්ලක් ඉදිරිපත් කිරිම" යන හිසින් යුතුව හංවැල්ල පාර පාදුක්ක ප්‍රධාන මාර්ගයේ දුම්රිය ස්ථානය හා අබාන්ස් වෙළඳසැල අතර ඇති ප්‍රදේශයේ බලපත්‍ර රහිත ජංගම වෙළඳ රථයක් මඟින් සවස් කාලයේ වෙළඳාම් සිදු කරන බැවින් කඩහිමිකරුවන් බදු මුදල් , ජලබිල්පත්, විදුලි බිල්පත් හා කඩකුලි ආදිය ගෙවීම ඇති බැවින් යම් සාධාරණයක් ලබා දෙන මෙන් ඉල්ලමින් ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය

**<u>04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.</u>**

**<u>ගරු සභාපතිතුමා</u>**

කල් දී ඇති ප්‍රශ්ණ නැහැ.

**<u>05.යථා පරිදි කල් දී ඇති යෝජනා.</u>**

**<u>ගරු සභාපතිතුමා</u>**

05 – (01) යෝජනාව මා විසින් ඉදිරිපත් කරනු ලබනවා.

**<u>05 – (01) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විශාල වශයෙන් දෛනිකව එකතු වන දිරන කසල කොම්පෝස්ට් පොහොර බවට පත් කිරීමේ අරමුණින් කොස්ගම ප්‍රදේශයේ පිහිටුවා ඇති කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාල සීමාව 2020.07.02 දින අවසන් වීමට නියමිත බැවින්, සාර්ථකව ක්‍රියාත්මක වන එම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාල සීමාව 2020.07.03 දින සිට 2021.01.02 දින දක්වා මාස 06 කින් දීර්ඝ කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනී හෙක්ටර් පීරිස් මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**<u>ගරු සභාපතිතුමා</u>**

මේ යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් අදහස් ඉදිරිපත් කරනවාද?

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයන්ත රණවක මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා මෙම මහ සභාව කාරක සභාවක් බවට පත් කළ යුතු යැයි යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  මංජුල වීරරත්න මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, මෙම කාරක සභා අවස්ථාව මහා සභාවක් බවට පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මේරි මාග්‍රට් මැතිතුමිය</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

මේ යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ යෝජනාවක් බවට සලකනවා.

**<u>ඉහත යෝජනාව  ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනී හෙක්ටර් පීරිස් මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත  විය.</u>**

**<u>05 – (02)   ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නඩත්තු කළ යුතු මාර්ග, ගොඩනැගිලි හා කාණු පද්ධතිය කඩිනමින් අඩු වියදමින් ගුණාත්මකව නඩත්තු කටයුතු සිදුකර ගැනීමේ අරමුණින් පිහිටුවන ලද සීතාවක ප්‍රාදේශීය සභා වැඩ ඒකක ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාල සීමාව 2020.08.14 දින අවසන් වීමට නියමිතව ඇති බැවින් ඉහත අරමුණු වඩාත් හොඳින් ඉටුකර ගැනීම සඳහා වැඩ ඒකක ව්‍යාපෘති කාලසීමාව 2020.08.14 දින සිට 2021.02.14 දින දක්වා  මාස 06 ක කාලසීමාවක් දක්වා දීර්ඝ කළයුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  නන්ද කුමාරසිංහ මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**ගරු සභාපතිතුමා**

මේ යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් අදහස් ඉදිරිපත් කරනවාද?

මෙම යෝජනාව සම්බන්ධයෙන් පහත නම් සදහන් ගරු මන්ත්‍රීවරුන් විසින් අදහස් ඉදිරිපත් කරන ලදී.

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී. සනී හෙක්ටර් පීරිස් මැතිතුමා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්. නන්ද කුමාරසිංහ මැතිතුමා
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ ප්‍රේමරත්න මැතිතුමා
05. ගරු උප සභාපති මංජුල ප්‍රදීප් කුමාර මැතිතුමා
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයන්ත රණවක මැතිතමා
07. ගරු සභාපති ජයන්ත රෝහණ මැතිතුමා

මේ යෝජනාව ඒකමතිකව සභා සම්මත වු යෝජනාවක් බවට සලකනවා.

**ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නන්ද කුමාරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.**

**05 – (03) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.**

සීතාවක ප්‍රාදේශීය සභාවට අයත් "හංවැල්ල පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ව්‍යාපෘතියේ" ව්‍යාපෘති කාල සීමාව 2020.08.01 දින අවසන් වීමට නියමිත බැවින්, එම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාල සීමාව 2020.08.02 දින සිට 2021.02.01 දින දක්වා මාස 06 ක කාල සීමාවක් දක්වා දිර්ඝ කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගීතාමණී ස්වර්ණලතා මැතිතුමිය**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**ගරු සභාපතිතුමා**

මේ යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් අදහස් ඉදිරිපත් කරනවාද?

මේ යෝජනාව ඒකමතිකව සභා සම්මත වු යෝජනාවක් බවට සලකනවා.

**ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ**

**<u>යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගීතාමණී ස්වර්ණලතා මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.</u>**

**<u>05 – (04) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

සීතාවක ප්‍රාදේශීය සභාවේ කොස්ගම උප කාර්යාලයේ පෙර පාසල් ගුරු තනතුරේ සේවය කරන ඒ. උදයකුමාරි පුෂ්පකාන්ති මහත්මිය මහජන බැංකුවේ පහත්ගම ශාඛාව මගින් ලබා ගැනීමට නියමිත දේපල ණය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපූර්ණය කළ යුතු පොලී මුදල, මෙම සභාවට ප්‍රතිපූර්ණය කරන තෙක් එම පොලී මුදල සභා අරමුදල් මගින් මහජන බැංකුවේ පහත්ගම ශාඛාව වෙත ගෙවිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදයකුමාර ගමගේ මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**<u>ගරු සභාපතිතුමා</u>**

මේ යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් අදහස් ඉදිරිපත් කරනවාද?

මේ යෝජනාව ඒකමතිකව සභා සම්මත වු යෝජනාවක් බවට සලකනවා.

**<u>ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදයකුමාර ගමගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.</u>**

**<u>05- (05). ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කළ යුතු පහත උප ලේඛනයේ විස්තර කරන්නට යෙදී ඇති ව්‍යාපෘති ඊට අනුරූපිව ඇති කොන්ත්‍රාත් සමිති/ ආයතන/ පුද්ගලයින් සමඟ ඊට ඉදිරියේ දක්වා ඇති ගිවිසුම්ගත මුදල අනුව ගිවිස ගනිමින් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අ. අ | ව්‍යාපෘතිය | මුල්‍ය සම්පාදනය | කොන්ත්‍රාත් සමිතිය/ ආයතනය/පුද්ගලයා | ගිවිසුම්ගත මුදල රු. |
|---|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| 01 | කොවිඩ් 19 වෛරස් තත්වය පාලනයෙන් පසු පෙර පාසල් ආරම්භ කිරීමට ප්‍රථම බල ප්‍රදේශයේ පෙර පාසල් ගුරුවරියන් දැනුවත් කිරීම. | සභා අරමුදල් | සරජ් ප්‍රධාන කාර්යාලය, හංවැල්ල | 238,600.00 |
| 02 | ඉහළ කොස්ගම උතුර පරණගම මාර්ගය සුදුසු පරිදි සංවර්ධනය කිරීම. | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන | සභාපති, ඉහළ කොස්ගම උතුර ගොවි සංවිධානය | 492,761.22 |
| 03 | කෙළිමඩල මහායාය පාර අතුරු පාර මුල් කොටස තාර දමා සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති, වග බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය | 375,199.50 |
| 04 | බොරළුගොඩලන්ද පාරේ පොදු ළිඳ ප්‍රතිසංස්කරණය (2020/06/10 දින මහ සභා අංක 05 (07) -03 හි ගිවිසුම්ගත සමිතිය වෙනුවට සෘජු ශ්‍රමික ලෙස සංශෝධනය) | සභා අරමුදල් | සෘජු ශ්‍රමික | 35,000.00 |
| 05 | පින්නවල විල උඩ දේවාල මාර්ගය කොටසක් සංවර්ධනය කිරීම | සභා අරමුදල් | සභාපති, පින්නවල දකුණ සහන වැඩිහිටි සංවිධානය | 483,089.32 |

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදයකුමාර ගමගේ මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**<u>ගරු සභාපතිතුමා</u>**

මේ යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් අදහස් ඉදිරිපත් කරනවාද?

මෙම යෝජනාව සම්බන්ධයෙන් පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් විසින් අදහස් ඉදිරිපත් කරන ලදී.

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා

මේ යෝජනාව ඒකමතිකව සභා සම්මත වු යෝජනාවක් බවට සලකනවා.

**<u>ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදයකුමාර ගමගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.</u>**

**ගරු සභාපතිතුමා**

තේ විවේකය සඳහා සභාවේ වැඩ කටයුතු විනාඩි 15 කට අත්හිටුවනවා.

**තේ පානය සඳහා සභාවේ වැඩ කටයුතු පෙ.ව. 11.35 ට අත්හිටුවන ලදී.**

**නැවතත් සභාවේ වැඩ කටයුතු පෙ.ව. 11.50 ට ආරම්භ කරන ලදී.**

**ගරු සභාපතිතුමා**

තේ විවේකයෙන් පසුව නැවතත් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරනවා. 05 (06) යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා.

**05- (06). ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.**

2018.05.11 වන දින පැවති මහා සභාවේ තීරණ අංක 05 - (06) යටතේ මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව මා වෙත ගෙවීම් කිරීමට පවරන ලද බලය අනුව මා විසින් කරන ලද පහත උප ලේඛනයේ විස්තර කරන්නට යෙදී ඇති ගෙවීම් ඊට අනුරූපීව ඇති ගෙවීම් ලබන්නා වෙත ඊට ඉදිරියෙන් දක්වා ඇති මුදල ගෙවීම අනුමත කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංක | වවුචර් අංකය හා දිනය | විස්තරය | මුදල රු. |
|---|---|---|---|
| 01 | 1280 – 1284<br>2020.06.09 | 2020 මැයි මස ප්‍රධාන කාර්යාලයේ, පාදුක්ක උප කාර්යාලයේ, කොස්ගම උප කාර්යාලයේ, හංවැල්ල උප කාර්යාලයේ හා කහහේන උප කාර්යාලයේ මාර්ග, සෞඛ්‍ය, ආයුර්වේද, රියදුරු, කාර්යාල, විදුලි, ආදාහනාගාර හා පුස්තකාල, පෙර පාසල් යන අංශයන්හි සේවයේ නියුතු ආදේශක සේවකයින් 48 දෙනෙකු හා සභාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන 51 දෙනෙකු වෙනුවෙන් දෛනික වැටුප් ගෙවීම. | 2,590,867.45 |
| 02 | 1384 - 1388<br>2020.06.25 | 2020 ජුනි මස ප්‍රධාන කාර්යාලයේ, පාදුක්ක උප කාර්යාලයේ, කොස්ගම උප කාර්යාලයේ, හංවැල්ල උප කාර්යාලයේ හා කහහේන උප කාර්යාලයේ සේවයේ නියුතු ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවකයින් 189 දෙනෙකු සඳහා වැටුප් ගෙවීම. | 7,633,449.68 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුසන්ත මැතිතුමා**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**<u>ගරු සභාපතිතුමා</u>**

මේ යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් අදහස් ඉදිරිපත් කරනවාද?

මේ යෝජනාව ඒකමතිකව සභා සම්මත වු යෝජනාවක් බවට සලකනවා.

**<u>ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුසන්ත මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.</u>**

**<u>05 – (07) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 11 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 184 වන වගන්තිය යටතේ 1988.01.08 වන දින අමාත්‍යවරයා විසින් සාදන ලද රීති පරිච්ඡින්න කර අංක 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 2 වන වගන්තිය යටතේ කියවිය යුතු එම පනතේ 184 වන වගන්තිය යටතේ සාදන ලද රීති කෙටුම්පතෙහි සඳහන් විදිවිධාන අනුව කටයුතු කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මේරි මාග්‍රට් මැතිතුමිය</u>**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**<u>ගරු සභාපතිතුමා</u>**

මේ යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් අදහස් ඉදිරිපත් කරනවාද?

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා මෙම මහ සභාව කාරක සභාවක් බවට පත් කළ යුතු යැයි යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදයකුමාර ගමගේ මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, මෙම කාරක සභා අවස්ථාව මහා සභාවක් බවට පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මේරි මාග්‍රට් මැතිතුමිය</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

මේ යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ යෝජනාවක් බවට සලකනවා.

**<u>ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මේරි මාග්‍රට් මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.</u>**

**01.කාරක සභා වාර්තා.**

06 **– (**01) 2020.06.23 - පරිසර හා පහසුකම් කාරක සභා රැස්වීමේ වාර්තාව.

**<u>2020.06.23 වන දින පවත්වන ලද පරිසර හා පහසුකම් කාරක සභා රැස්වීමේ වාර්තාව මහ සභාව විසින් සලකා බලන ලදී.</u>**

06 **– (**02) 2020.06.25 - නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීමේ වාර්තාව.

**<u>2020.06.25 වන දින පවත්වන ලද නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීමේ වාර්තාව මහ සභාව විසින් සලකා බලන ලදී.</u>**

06 **– (**03) 2020.06.26 - කාර්මික සේවා කාරක සභා රැස්වීමේ වාර්තාව.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්ද්‍රානි සෙනෙහෙලතා පද්මසීලි මැතිතුමිය</u>**

පිටු අංක 08 අනු අංක 21 නන්ද කුමාරසිංහ මැතිතුමාගේ ලිපියක් සම්බන්ධයෙන් වැරදීමකින් වෙන්න ඇති - මීටර් 10 ලෙස සදහන් වෙලා තියෙනවා ඒක අඩි 10 වෙන්න ඇති.

**2020.06.26 වන දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව පහත පරිදි සංශෝධනය විය යුතුයි**.

2020.05.28 දින පැවති කාරක සභාවේ තීරණ අංක 01 (07) යටතේ දැක්වෙන හංවැල්ල ගිරාඉඹුල ප්‍රදේශවාසීන් විසින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්. නන්දකුමාරසිංහ මැතිතුමා විසින් 2020.02.25 දිනැතිව යොමු කරන ලද ලිපිය සඳහා හංවැල්ල තාක්ෂණ නිලධාරි වාර්තාව අනුව කැලගහවත්ත පාරේ කහටපිටිය තොටුපල පාරින් ආරම්භ වී වජිර ප්‍රදීප් මහතාගේ නිවස අසලින් අවසන් වන 75 m දිග හා අඩි 10 පළල මාර්ගය සීතාවක ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සඳහා ඉදිරි මහ සභාවට යෝජනාවක් ඉදිරිපත් කිරිම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදී.

**<u>2020.06.26 වන දින පවත්වන ලද කාර්මික සේවා කාරක සභා රැස්වීමේ වාර්තාව ඉහත සංශෝධනයට යටත්ව මහ සභාව විසින් සලකා බලන ලදී.</u>**

06 **– (**04) 2020.06.29 - මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා රැස්වීමේ වාර්තාව.

**<u>2020.06.29 වන දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා රැස්වීමේ වාර්තාව මහ සභාව විසින් සලකා බලන ලදී.</u>**

06 **– (**05) 2020.06.10 - ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේ වාර්තාව.

**<u>2020.06.10 වන දින පවත්වන ලද ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේ වාර්තාව මහ සභාව විසින් සලකා බලන ලදී.</u>**

06 **– (**06) 2020.06.22 - ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේ වාර්තාව.

**<u>2020.06.22 වන දින පවත්වන ලද ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේ වාර්තාව මහ සභාව විසින් සලකා බලන ලදී.</u>**

06 **– (**06) 2020.06.29 - ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේ වාර්තාව.

**<u>2020.06.29 වන දින පවත්වන ලද ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේ වාර්තාව මහ සභාව විසින් සලකා බලන ලදී.</u>**

## 07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශය.

07 – (01) 2020 අප්‍රේල් මාසය ලැබීම් හා වියදම් පිළිබඳ ප්‍රකාශය.

**<u>2020 මාර්තු මස ලැබීම් හා වියදම් පිළිබඳ ප්‍රකාශය මහ සභාව විසින් සලකා බලන ලදී.</u>**

## 08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික ප්‍රකාශ.

**<u>ගරු සභාපතිතුමා</u>**

පෞද්ගලික ප්‍රකාශය ඉදිරිපත් කිරිම සඳහා අයෝම මධු ප්‍රසාද් දේවගේ මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයෝම මධු ප්‍රසාද් දේවගේ මැතිතුමා</u>**

පසුගිය යහපාලන රජය මඟින් සංවර්ධනය කරන ලද පාදුක්ක මහජන ක්‍රිඩාංගනයේ මේ වනවිට විශාල අඩුපාඩු ප්‍රමාණයක් පවතී.

විශේෂයෙන් එම ක්‍රීඩාංගනයේ සෝලා විදුලි ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම නිසා රාත්‍රී කාලයේ ඇවිදින මංතීරුව පරිහරණය කරන අය සඳහා එම මං තීරුව භාවිතයට ගැනීමට නොහැකි වී ඇත. දැනට පාදුක්ක සති පොළෙහි සෝලා විදුලි පද්ධතියේ අතිරික්ත විදුලියක් නිපදවෙන බැවින් එම අතිරික්ත විදුලිය තුළින් මෙම ක්‍රීඩා පිටියට අවශ්‍ය විදුලිය ලබා ගැනීමේ හැකියාව පිළිබඳ විමසා බලා ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය දැනුවත් කරන මෙන් ඉල්ලා සිටිමි.
මේ පිළිබඳව අදාල අංශ සමඟ හැකි ඉක්මණින් සාකච්ඡාවක් ලබාගෙන මෙහි අඩුපාඩු සම්පූර්ණ කර ක්‍රීඩා පිටිය සීතාවක ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට කටයුතු ඉක්මන් කරන ලෙස ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිමි.
පිටපත් :-

1. ගරු නාගරික සංවර්ධන අමාත්‍යතුමා
2. ලේකම් නාගරික සංවර්ධන අමාත්‍යාංශය
3. අධ්‍යක්ෂ - නාගරික සංවර්ධණ අධිකාරිය
4. ව්‍යාපෘති භාර නිලධාරි - පාදුක්ක ක්‍රීඩාංගනය සංවර්ධනය කිරිම

ගරු සභාපතිතුමනි, පාදුක්ක නගරයේ තියෙන පාදුක්ක ක්‍රීඩාංගනය මම හිතන්නේ ඔබතුමත් දන්නවා පසුගිය කාලේ යහපාලන රජය මඟින් ආරම්භ කළා නමුත් එකේ සංවර්ධන කටයුතු අවසන් කරලා නෙවෙයි භාර දුනනේ මම හිතන්නේ තාමත් මේක සීතාවක ප්‍රාදේශීය සභාවට පවරලා නෑ පහුගිය කාලේ ගාමිණී ලොකුගේ ඇමතිතුමා අමාත්‍යවරයා විදියට පාදුක්ක නගරයේ සංචාරය කරලා ඒ කටයුතු පිළිබඳව නිලධාරීන් සමඟ සාකච්ඡා කලාට පස්සේ මේ තියෙන සොලා කණු ටික ඒ තැන් වලින් ඉවත් කරලා ඇවිදින මංතීරුව නිදහස් ලෙස ඒ අවශ්‍ය ප්‍රමාණයට ඒ මංතීරුව ප්‍රතිසංස්කරණය කරන්න යෝජනා කළා ඒකෙදි ඒ කණු ටික නැවත මුල්ලකට අයිනකට සවි කරලා ඒ මංතීරුව ඇවිදින්න පුළුවන් විදියට අවහිරය මගහැර ගන්නට යෝජනා කළ මම හිතන්නේ දැනට ඊයේ නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයත් සමඟ සාකච්ඡා කලා එතුමා කිව්වේ ඔවුන්ට මේක ටෙන්ඩර් කරලා කරන්න බෑ නමුත් අපිට මේක ප්‍රාදේශීය සභාව විදියට මේක අපි සාකච්ඡා කරලා හැදුවොත් ඔවුන්ට ඒ මුදල මේ ප්‍රාදේශීය සභාවට ලබා දෙන්න පුළුවන් කියලා ඒක නිසා මම ඉල්ලීමක් කරනවා හැකි ඉක්මණින් මේ නිලධාරීන් සමඟ සාකච්ඡාවක් කරලා සති පොලේ තියෙන සෝලා එකේ විදුලි අතිරික්තයක් තියෙනවා ඒ විදුලි අතිරික්තයත් සමඟ මේ සෝලා එක ක්‍රියාත්මක කරන්න අපිට හැකියාවක් ලැබෙයි මේ පොල සහ ක්‍රීඩාංගනය දෙකම ඒ නිසා මේ අදාල නිලධාරි එක්ක සභාවේ සභාපතිතුමා ඔබතුමා එක්ක සාකච්ඡාවක් තියන්න ඉතා ඉක්මනින් මේ කටයුතු කරන්න පුළුවන් ඉතා විශාල ප්‍රමාණයක් ජනතාව මේ ක්‍රීඩාංගනයේ ඉන්නවා. ඒ නිසා හැකි ඉක්මණින් මේක නිරාකරණය කරලා දෙන්න කියලා ඉල්ලනවා.

**<u>ගරු සභාපතිතුමා</u>**

අපිටත් අයිතිය ලැබෙනතුරු අපිට ඒ කටයුතු කරන්න අමාරුයි. අද සවස්වරුවේ නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡාවක් තියෙනවා අපි මේ ගැනත් ගිහින් කතා කරන්නම් අපිට පවරන්නේ නැතුව තමයි අපි සමහර කටයුතු කරන්නේ ඔබතුමාලට සහ අපිට ලැබෙන පැමිණිලි නිසා අපි සමහර කටයුතු කරනවා. නමුත් අපිට නීත්‍යානුකූල අයිතියක් නැහැ අපි කෙසේ හෝ මේකේ අයිතිය ලබා ගැනීමෙන් පසුව ඒ අවශ්‍ය කටයුතු කරමු.

නිවේදන යටතේ මම ඉදිරිපත් කළා වරිපනම් මෘදුකාංගය නොමිලේ ලබා ගැනීම සම්බන්ධව කරුනු කාරණා දැන ගන්න ඕනේ නම් ඒ පිළිබඳ කතා කරන්න පුළුවන් එහෙම නැතිනම් මුදල් කමිටුවෙදි කතා කරන්නත් පුළුවන්.

අද දින මහ සභාවේ වැඩ කටයුතු අවසන් කිරීමට සුදානම් වෙන්නේ. අද දින සභාවට නොපැමිණි චන්දන මුදුන්කොටුව මැතිතුමාටත්, විමල් ප්‍රසන්න මැතිතුමාටත්, චන්දන ලියනගේ මැතිතුමාටත්, දනුෂ්කි ප්‍රභානි අල්මේදා මැතිතුමියටත් අමල් පුස්සැල්ල මැතිතුමාටත්, චන්දන සූරියආරච්චි මැතිතුමාටත් නිවාඩු අනුමත කරන ලෙස මම යෝජනා කරනවා.ඒ වගේම සභාවට සහභාගී වූ උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරි මණ්ඩලයටත්, කාර්ය මණ්ඩලයටත්, ජනමාධ්‍ය මහත්වරුන්ටත් අපේ ගෞරවයත් ස්තුතියත් පුද කරනවා. සහභාගි වූ සියළුදෙනාටම ස්තුතියි.

**සභාවේ වැඩ කටයුතු ප.ව. 12.20 ට නිමාවට පත්විය.**